**ශීර්ෂ 120 - ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂ | දෙපාර්තමේන්තුව |
|---|---|
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1ඡේදයේ සඳහන් ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 2015.09.30 |
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 2015.07.29 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දිමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු රු.මිලියන 2,279.90 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 2,079.57 ක් උපයෝජනය කර තිබිමෙන් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු. මිලියන 193.97 ක් හා රු. මිලියන 6.36 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9.53 ක් හා සියයට 2.59 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 120 | 2,034.35 | 1,840.38 | 193.97 | 9.53 |
| 217 | 245.55 | 239.19 | 6.36 | 2.59 |
| **එකතුව** | **2,279.90** | **2,079.57** | **200.33** | **8.79** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

## 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වූ දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12001 | 26.0 | 16.6 | 8.0 | 15.5 | 80.0 | 54.5 |
| 21701 | 12.0 | 8.9 | 7.0 | 9.0 | 75.0 | 38.8 |

## 2.3 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 8.49 ක් වූ අතර දෙපාර්තමේන්තුවේ එදිනට ශේෂයක් නොතිබුණි.

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 2.12 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 6000/0000/00/0015/0033/000 | 1.81 |
| -එම- | 6000/0000/00/0006/0079/000 | 0.31 |
| **එකතුව** | | **2.12** |

**2.5 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 4 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශීර්ෂ 120 - ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|---|
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය. | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. |
| (ආ) | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය |

**3.2 විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී කාන්තා හිංසනය හා ළමා අපයෝජනය වැලැක්වීම සඳහා රු.6,072,137 ක් වැය කර පැවැත්වූ රැස්වීමේදී සාකච්ඡා කළ කරුණු, එහිදී ගනු ලැබූ තීරණ හා ඉදිරි ක්‍රියාමාර්ග ඇතුළත් විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ වර්ෂ 5 කට අනුරාධපුර සංචාරක බංගලාවක කුලියට ගෙන තිබුණි. එම කාල පරිච්ඡේදය සඳහා එම බංගලාවට කුලී වශයෙන් රු.5,256,428 ක් ගෙවා තිබුණි. 2015 සැප්තැම්බර් 23 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව 2010 වාර්ෂයේදි හා 2012 වර්ෂයේදී පැවැත්වූ උත්සව 2 ක් හා

භාණ්ඩ සමීක්ෂණ 4 කට සහභාගිවූ නිලධාරීන් 23 දෙනෙකු එහි නවාතැන්ලත් බව සඳහන් කර තිබුණි. ඒ අනුව 2011, 2013 හා 2014 වර්ෂවල නවාතැන්ගත් නිලධාරින්ගේ නම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

-----------------------------------

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ විගණන විමසුම් 11 කට 2015 ඔක්තෝබර් 13 දින වන විටද, පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගනුදෙනුවල වටිනාකම රු.50,873,885 ක් විය.

**3.4 විසර්ජන ගිණුම**

----------------

**3.4.1 අයවැය විචලනය**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු. 32,475,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 11 කට රු.94,268,232 ක අධි ප්‍රතිපාදන සළසා තිබිම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 31 ක සිට සියයට 96 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.5 අග්‍රිම ගිණුම්**

-------------

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිම කළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 18 කට අදාළව ලබාදී තිබුණු එකතුව රු.130,207 ක තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී මාස 01ක සිට මාස 07 ක් දක්වා කාල පරාසයක් තුළ නිරවුල් කර තිබුණි.

**3.6 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------

විෂය අංක 12001 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරික්ෂාවේදී 2013 දෙසැම්බර් 31 දින ආපදා ණය සඳහා නිකුත් කර තිබූ එකතුව රු.2,962,350 ක චෙක්පත් 19 ක් මාස 03 ක සිට මාස 06 ක් දක්වා කාල පමාවකින් පසු නිලධාරින්ට ලබාදී තිබුණි. මේ නිසා නිලධාරින්ගෙන් අය කළ යුතුව තිබුණු (ගණනය කළ) රු. 45,705 ක ණය පොලී රජයට අහිමි වි තිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**
**--------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) **නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**
**------------------------------------------**

අමාත්‍යාංශය සතු වාහන 6 ක් ධාවනයෙන් ඉවත් කර මාස 01 ක සිට මාස 10 ක් අතර කාල පරාසයක් ගත වී තිබුණු අතර එක් වාහනයක් අළුත්වැඩියා කටයුතු සඳහා ගරාජයකට 2015 මාර්තු මාසයේදී භාරදී තිබුණි. එම වාහන සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 771 පරිදි කටයුතු කර නොතිබුණි**.**

**(ආ) වාර්ෂික භාණ්ඩ සමික්ෂණ පැවැත්වීම**
**---------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේ වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2015 මැයි 21 දින සිට ජුලි 30 දින දක්වා මාස 2 ක් ප්‍රමාද කර එම භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ii) 2013 හා 2014 වර්ෂවල සමීක්ෂණ මණ්ඩලයෙන් පෙන්වා දී තිබුණු අතිරික්තතා, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(iii) අමාත්‍යාංශයට අයත්ව තිබී වසා දමන ලද උපදේශන මධ්‍යස්ථාන, වැඩිහිටි මධ්‍යස්ථාන හා ප්‍රධාන කාර්යාලයේ ඉවත් කළ යුතු බවට නිර්දේශ කළ භාණ්ඩ රාශියක් 2015 ඔක්තෝබර් 15 දින වන විටත් ගබඩා කර තබා තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**
**------------------------------**

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01ට අඩු බේරුම් නොකළ බැරකම් රු.1,077,573 ක් විය.

**3.8** **අනුකූල නොවීම**

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

නියැදි විගණන පරික්ෂණවලදී නිරික්ෂණය වු නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) | මුදල් රෙගුලාසි 128(1)(අ) | 133,950 | අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේ පැවැත්විය හැකි පුහුණු වැඩසටහන් බාහිර පුහුණු මධ්‍යස්ථානයක පවත්වා තිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 272(3) | 319,558,592 | ගෙවීම් වවුචර් සති 06ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, 2014 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළ ගෙවීම් වවුචර් 2015 ජුලි 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 165(1), 185(2) හා 186 | 1,839,236 | ලැබෙන සියලුම මුදල්, මුදල් භාර ගැනිමේ නිලධාරියාට ලැබුණු දිනයේදිම, මුදල් පොතේද ඒ සඳහා නියමිත පොත්පත්වලද සටහන් කළ යුතු අතර මුදල් ලැබුණු දින සිට දින 7 ක සිට දින 28 ක් දක්වා කාල ප්‍රමාදයකින් පසුව ගිණුම්ගත කිරීම් හා බැංකු ගත කිරිම් සිදු කර තිබු අවස්ථා පැවැතුණි. |
| | (iv) | මුදල් රෙගුලාසි 168(1), | - | රජය වෙනුවෙන් යම් |

| | | | |
|---|---|---|---|
| | 169 හා 184 | | මුදලක් ලැබුණු විට නියමිත ආකෘති පත්‍රයේ යන්ත්‍රානුසාරයෙන් අංක කරන ලද කුවිතාන්සියක් නිකුත් කළ යුතු වුවත්, මුදල් භාරගෙන කුවිතාන්සි නිකුත් නොකර පොත්වල තිබෙන්නට ඉඩ හැර තිබූ අවස්ථා රාශියක් තිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 340(1) හා 342(1) | - | භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා උප පත්‍රිකා පොත් සුරක්ෂිතව තබා ගෙන නිසි පරිදි පරිහරණය කළ යුතු වුවත්, පොත් නිකුත් කිරිමේදි අනුක්‍රමික අංක අනු පිළිවෙළට නිකුත් නොකළ අවස්ථා 9 ක් තිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 341 | - | උප පත්‍රිකා පොත් ලැබීම් හා ඒ පිළිබඳ ක්‍රියා සටහන් කර ගනු සඳහා ජී.ඒ.ඇන් 20 ප්‍රකාර ලේඛනයක් පවත්වා ගතයුතු වුවද එසේ කර නොතිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 342(6)(ආ) | - | නැවත පාවිච්චි කළ නොහැකි කුවිතාන්සි අවලංගු කළ යුතු වුවත්, පාවිච්චි නොකළ කුවිතාන්සි 19 ක් ඇතුළත් උප පත්‍රිකා පොත් 2ක් තිබුණි. |
| (vii) | මුදල් රෙගුලාසි 343 | - | පාවිච්චි කළ හෝ නොකළ උප පත්‍රිකා 4 ක් 2014 ඔක්තෝබර් 31 දින හා 2014 නොවැම්බර් 21 දින නැති වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ක්‍රියා කර නොතිබුණි. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 1998 දෙසැම්බර් 27 දිනැති අංක 62/89 දරන චක්‍රලේඛය | 694,850 | දිනපතා පුවත්පත්වලින් එක් පිටපත බැගින් භාෂාත්‍රයෙන් අඩු වශයෙන් දෙකක් මිලදී ගත යුතු වුවත්, 2014 වර්ෂයේදී දිනපතා පුවත්පත් වර්ග 2 සිට 30 දක්වා පිටපත බැගින් මිලදී ගෙන තිබුණි. |

**(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛය**

| | | |
|---|---|---|
| 2011 පෙබරවාරි 21 දිනැති අංක 449 දරන චක්‍රලේඛය | 1,145,000 | බාහිර පුද්ගලයකුගේ /පුද්ගල කණ්ඩායමකගේ සේවයක් ලබා ගැනිමේදි එම සේවාව සඳහා ගෙවිය හැකි උපරිම මුදල රු.30,000 වුවත්, අමාත්‍යාංශය විසින් පිළියෙල කරනු ලැබූ ස්ත්‍රීන්ට එරෙහිව සියළු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුති (සිඩෝ) වාර්තාවේ වගන්ති සකස් කිරිමට එක් නිලධාරියෙකුට රු.80,000 ක් බැගින් නිලධාරින් 12 දෙනෙකුට සහ තවත් නිලධාරියෙකුට රු.185,000 ක් ගෙවා තිබුණි. |

**3.9 දේශිය මුල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම**

**භාණ්ඩ හා සේවා සැපයීම් රහිතව මුදල් නිදහස් කිරිම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් 2014 නොවැම්බර් 17 දින ඇනවුම් කළ රු.10,930,494 ක් වටිනා මහන මැෂින් 439 කට 2014 දෙසැම්බර් 31 දින මුදල් ගෙවා තිබුණු නමුත් එම ආයතනයෙන් භාණ්ඩ ලැබී තිබුණේ 2015 පෙබරවාරි හා මාර්තු මාසවලදීය.

(ආ) 2014 දෙසැම්බර් 31 දින රු.3,164,800 ක් වටිනා වතුර මෝටර් 86 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් 76 ක් භාරගත් බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් තහවුරුවක් ලබා නොගෙන මුදල් ගෙවා තිබුණි.

(ඇ) අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරය ඉදිකිරීමේ කටයුතු 2015 ඔක්තෝබර් වන විටත් අවසන්කර නොතිබුණු අතර ඒ වෙනුවෙන් රු.9,944,393 ක් වටිනා චෙක්පත් 2014 දෙසැම්බර් 31 දින ලියා තිබුණි. එම චෙක්පත් 2015 ඔක්තෝබර් 23 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට භාරදී තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දින ගෙවීම් කළ රු.3,756,260 ක් වටිනා ගැහැණු දරු ආරක්ෂණය පිළිබඳ නීති නාමාවලිය හා මුල් ළමාවිය සංවර්ධන ප්‍රමිතීන් යන පොත් 12000 ක් 2015 නොවැම්බර් මාසය වන විටත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මුද්‍රණය කර නොතිබුණි.

**3.10 කාර්යසාධනය**

-------------------

අමාත්‍යාංශය විසින් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

**(අ) ප්‍රමාණාත්මක ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

---------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය සඳහා මහා බ්‍රිතාන්‍ය පවුම් 1,494,000 ක් 2008 වර්ෂයේදී ළමා රැකවරණ ආයතනයෙන් ලැබී භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කර තිබුණි. වසර 06 ක කාලයක් ගතවීමෙන් පසු ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණු අතර එම මුදල අදාළ කාර්යයන්හි යොදා ගැනීම සඳහා පනතක් මගින් "මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධනය සඳහා" භාරකාර අරමුදලක් පිහිටුවිය යුතු බවට ළමා රැකවරණ ආයතනය හා අමාත්‍යාංශය අතර ඇති කරගත් භාරකාර ඔප්පුවේ සඳහන් වී තිබුණි. නමුත් අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් කටයුතු කළද එම අරමුදල පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොහැකි වී තිබුණි.

(ii) ළමා රැකවරණ ආයතනයෙන් 2008 වර්ෂයේදී ප්‍රදානය කර තිබු බ්‍රිතාන්‍ය පවුම් 1,494,000 ක් ප්‍රයෝජනයට ගැනීමේ ක්‍රමවේදය වශයෙන් අමාත්‍යාංශය වෙත සළසා දී තිබුණු රු.මිලියන 700 ක මූල්‍ය ප්‍රතිපාදන හා කොඩි අලෙවියෙන්

ලැබෙන මුදල් උපයෝජන කර ගනිමින් සංදේශයේ සඳහන් වැඩසටහන් වඩා ඵලදායී ලෙස ක්‍රියාත්මක කළ යුතු බව 2014 ජනවාරි 24 දිනැති අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. නමුත් 2014 වර්ෂයේදී මේ සඳහා ලැබුණු රු.මිලියන 600 න් රු.මිලියන 537.38 වැය කර තිබුණු අතර රු.මිලියන 70 ක් නැවත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට 2014 දෙසැම්බර් 31 දින යවා තිබුණි.

**(ආ) සැලසුම් කිරීම**

---------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙළ කළ ක්‍රියාකාරි සැලැස්ම අනුව කටයුතු නොකළ අවස්ථා පහත දැක්වේ.

(I) ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ළමා හා කාන්තා සංවර්ධන ඒකක පිහිටුවිම සඳහා රු.මිලියන 9.5 ක ප්‍රතිපාදන සළසා ඒකක 95 පිහිටුවීමට සැලැසුම් කර තිබුණත්, රු.මිලියන 5.43 ක් වැය කර ඒකක 34 ක් පමණක් පිහිටුවා තිබුණි

(II) ස්ත්‍රි පුරුෂ සමාජභාවය මත සිදුවන හිංසනය පිටුදැකිමේ වැඩසටහන් සඳහා රු.මිලියන 0.5 ක ප්‍රතිපාදන සළසා වැඩසටහන් 5 ක් පැවැත්විමට ඉලක්ක කර තිබුණත්, ඒ යටතේ අමාත්‍යාංශයේ ක්ෂේත්‍ර නිලධාරින් දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්විම හා නාය යෑමෙන් අවතැන් වුවන්ට සහන සැපයීම සිදු කර තිබුණි.

(III) විදේශ ගතවන කාන්තාවන්ගේ දරුවන් සම්බන්ධයෙන් සමීක්ෂණයන් සිදුකිරීමට රු.මිලියන 1.2 ක ප්‍රතිපාදන සළසා තිබුණද, එම සමික්ෂණය වෙනත් අමාත්‍යාංශයක් මගින් සිදුකළ බැවින් මේ සඳහා සළසා තිබුණු රු.මිලියන 0 .418 ක් අනිකුත් සංවර්ධන වැඩසටහන් අධික්ෂණය හා පසුවිපරම සඳහා යොදාගෙන තිබුණි.

(iv) කාන්තා දිනය වෙනුවෙන් රු.මිලියන 4.65 ක් වැය කිරිමට සැලැසුම් කර තිබුණද, ඒ සඳහා රු.මිලියන 5.73 ක් එනම් රු.මිලියන 1.08 ක් ඉක්මවා වැය කර තිබුණි.

3.11 **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**--------------------------------------**

**ගැලපුම් කළ යුතු ශේෂ**

---------------------------

අමාත්‍යාංශයේ 2014දෙසැම්බර් මාසයට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | **ගැලපුම් පිළිබඳ විස්තරය** | කාල විශ්ලේෂණය | |
|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 ට අඩු |
| | | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | - | 20,644 |
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | - | 461,440 |
| (iii) | හඳුනා නොගත් බැර | 401,928 | 106,682 |

**3.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**----------------------------------**

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු මතභේදාත්මක ස්වරූපයේ වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලැබීම් නියෝග අනුව ව්‍යාංජන භාජන 36 ක්, තාච්චි 18ක් හා තෙල් ඉසින යන්ත්‍රයක් එම කාර්යාල විසින් බාර ගෙන තිබුණු නමුත් අමාත්‍යාංශයේ නිකුත් කිරීම් නියෝගවල එම භාණ්ඩ නිකුත් කළ බව දක්වා නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් නොකර ලිස්සන බෝට්ටු 100 ක් රු.27,000,000 කට මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. එම බෝට්ටු නිෂ්පාදනයට භාවිතා කළ යුතු GI බටවල ඝනකම මිල කියුමේ දක්වා නොතිබුණු අතර ලංවා වානේ යොදා නිපදවූ එම බෝට්ටු වෙනුවෙන් ඇණවුම් බාරදී තිබුණි. 2013 දෙසැම්බර් 31 දින චෙක්පත් ලියා පසුව 2014 දෙසැම්බර් 19 දින අවලංගු කර 2014 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා එම මුදල් යොදා ගෙන තිබුණි.

**3.13 අවිධිමත් ගනුදෙනු**

---------------------

අමාත්‍යාංශයේ අරමුණට අනුගත නොවූ පුවත්පත් දැන්වීම් 2ක් පළ කිරිමට රු.998,500 ක් වැය කර තිබුණි.

**3.14 අනාර්ථික ගනුදෙනු**

---------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ළමා මිතුරුකම පිළිබඳ දකුණු ආසියානු වාර්තාව අතිගරු ජනාධිපතිතුමාට භාරදීම පිළිබඳ වර්ණ පිටුවක් පුවත්පතක පළ කිරීමට රු.448,280 ක් වැය කර තිබුණි.

(ආ) කාන්තාවන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා විශාල කාර්යභාරයන් රාශියක් ඉටුකිරිමට තිබියදී ජාත්‍යන්තර කාන්තා දිනය සැමරිමේ උත්සවයට රු.2,419,032 ක් වැය කර තිබුණි.

**3.15 කළමනාකරණ දූර්වලතා**

---------------------------

නියැදි විගණන පරික්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2014 දෙසැම්බර් 06 දින පැවැත්වීමට නියමිතව තිබුණු උත්සවයක් අවලංගු කර තිබියදී එම උත්සවයේදී බෙදාදීමට 2014 දෙසැම්බර් 31 දින රු.256,050 ක් වැය කර අත්පොත් 500 ක් මුද්‍රණය කර තිබුණි. ඉන් පොත් 70 ක් පමණක් බෙදාදී තිබුණු අතර රු.220,203 ක් වටිනා පොත් 430 ක් 2015 සැප්තැම්බර් 30 දින වන විටත් අමාත්‍යාංශයේ ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

(ආ) ආර්ථික අපහසුතා සහිත පවුල්වල දරුවන් හා වකුගඩු රෝගී දරුවන් 1891 ක් සඳහා 2014 වර්ෂයේදී ශිෂ්‍යාධාර ලබා දීම වෙනුවෙන් රු.11,694,000 ක් වටිනා චෙක්පත් 2 ක් 2014 නොවැම්බර් 27 දින ජාතික ඉතිරි කිරිමේ බැංකුවට නිකුත් කර තිබුණි. බැංකුව එම මුදල උපලබ්ධි කරගෙන තිබුණද, එම මුදල් දරුවන්ගේ ගිණුම්වලට මාස 07 ක පමණ ප්‍රමාදයකින් පසුව 2015 ජූලි මාසයේදී බැර කර තිබුණි. 2015 අගෝස්තු 10 දින වන විටත් පාස්පොත් 233 ක් අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට යවා නොතිබූ අතර අනිකුත් පාස්පොත් ප්‍රතිලාභී දරුවන්ට ලැබුණු බවට තහවුරුවක්ද ලබාගෙන නොතිබුණි. මේ අනුව මාස 06කට අදාළ දළ වශයෙන් රු.311,840 ක පොලීද එම දරුවන්ට ලබාදිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලට බෙදා හැරීමට 2013 දෙසැම්බර් 30 දින රු.830,000 ක් වැයකර කෙටි චිත්‍රපට 4 ඇතුළත් ඩීවීඩී තැටි 10,000 ක් මුද්‍රණය කර තිබුණි. 2015 ඔක්තෝබර් 10 දින වන විටත් ඉන් තැටි 8,750ක් කාන්තා කමිටු ගබඩාවේ රඳවා ගෙන තිබූ අතර තවත් ඩීවීඩී තැටි 700 ක් පිටපත් කිරීම සඳහා රු.70,000 ක් වැයකර තිබුණි. මෙම තැටි බෙදා හැරීම පිළිබඳ පැහැදිලි විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) නාගරික සංවර්ධන අධිකාරියේ සුභසාධක සංගමය විසින් පවත්වාගෙන යනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථානය සංවර්ධන කිරීමේ කටයුතු සඳහා එම සුභසාධක සංගමයේ සභාපති සමග ගිවිසුමකට අමාත්‍යාංශය එළඹ තිබුණි. ඒ අනුව අධිකාරියේ සභාපති නමට රු.2,918,152 ක චෙක්පතක් 2014 දෙසැම්බර් 31 දින ලියා 2015 ජුනි 30 දින තෙක් අමාත්‍යාංශයේ රඳවාගෙන අවලංගු කර තිබුණි. මෙම මුදල 2014 වර්ෂයේ වියදම් ලෙස සටහන් කර තිබුණු අතර එම මුදල් 2015 වියදම් කිරීම සඳහා යොදා ගෙන තිබුණි.

(ඉ) 2001 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලය තුළදී මුද්‍රණය කළ පොත් 742 ක් හා ඩීවීඩී පට 12 ක් බෙදා නොදී වසර ගණනාවක් කාන්තා කාර්යාංශයේ ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී මුද්‍රණය කළ රු.36,800 ක් වටිනා ඩීවීඩී තැටි 200 ක්ද රු.230,940 ක් වටිනා පොත් 12,957ක්ද, රු.61,600 ක් වටිනා ලිපිගොනු කවර 1,600 ක්ද, රු.83,500 ක් වටිනා අත් පත්‍රිකා 18,050 ක්ද, රු.31,000 ක් වටිනා පෝස්ටර් 5,000 ක්ද, 2015 නොවැම්බර් මාසය වන විටත් අමාත්‍යාංශයේ ගබඩාවේ රඳවා ගෙන තිබුණි.

## 3.16 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**
---------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 24 | 03 |
| (ii) | තෘතියික මට්ටම | 17 | 12 | 05 |
| (iii) | ද්විතියික මට්ටම | 1,423 | 1,113 | 310 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 68 | 64 | 4 |
| | **එකතුව** | **1,535** | **1,213** | **322** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 322 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 4 ශීර්ෂ 217 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

### 4.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි |
| ප්‍රසම්පාදන/ තාක්ෂණ ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | ලේඛනයක් පවත්වා නොතිබුණි |
| ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය | ලේඛනයක් පවත්වා නොතිබුණි |

**4.2 විසර්ජන ගිණුම**

**4.2.1 අයවැය විචලනය**

වැය විෂයයන් 09 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 30 ක සිට සියයට 96.5 ක් දක්වා පරාසයක ප්‍රමාණවලින් වෙනත් වැය විෂයයන්ට ප්‍රතිපාදන මාරු කර තිබුණි.

**4.2.2 වෙනත් අමාත්‍යාංශ විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් ලබාදුන් රු.මිලියන 82.5 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 70.1 ක් උපයෝජනය කර තිබුණු අතර ඉන් රු.මිලියන 12.4 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**4.2.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 21701 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

2014 අප්‍රේල් මාසයේදී විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ 2014 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොවූ රු.153,310 ක ණය ශේෂය කේවල ණය ශේෂ වර්ගීකරණය යටතේ විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් අය විය යුතු ණය ශේෂයක් ලෙස පෙන්වා නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණයේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රිය වත්කම්**

දෙපාර්තමේන්තුව සතු කැබ් රථයක් වසර 1 ½ ක පමණ කාලයක් ධාවනයට යොදා නොගෙන නිෂ්ක්‍රියව පරත්ත පුහුණු මධ්‍යස්ථානයේ ගාල් කර තිබුණි.

**(ආ) වත්කම් ඌන උපයෝජනය**
**-----------------------------**

සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කළ ව්‍යාපෘතීන්/වැඩසටහන් වෙනුවෙන් යුනිසෙෆ් ව්‍යාපෘතියෙන් ලැබුණු රු.1,294,385 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගෙන 2014 දෙසැම්බර් 31 දින අමාත්‍යාංශය වෙත යවා තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**
**--------------------------------------**

2014 වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දුන් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි**.**

**4.4 අනුකූල නොවීම**
**------------------**
**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**
**-------------------------------------------**
දෙපාර්තමේන්තුව සතු වෑන් රථය 2014 ඔක්තෝබර් මාසයේදී අනතුරකට භාජනය වී තිබු අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාර පොලිස් වාර්තාව, මූලික පරික්ෂණ වාර්තාව, ප්‍රාරම්භක වාර්තා හා අවසන් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි

**4.5 කාර්යසාධනය**
**---------------**
2014 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාව අනුව පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට නොහැකි වී තිබුණි.

(අ) සෙවන සරණ කැපකරු මාපිය ක්‍රමය යටතේ ළමුන් 125 දෙනෙකුට රු.මිලියන 281 ක ප්‍රතිලාභ ලබා දීමට සැලැසුම් කර තිබුණත් ළමුන් 71 දෙනෙකුට රු.මිලියන 248 ක පමණක් ප්‍රතිලාභ ලබා දී තිබුණි.

(ආ) ළමා මිතුරු සතුටු මධ්‍යස්ථාන 50 කට රු.800,000 ක ප්‍රතිපාදන සළසාදී තිබුණද රු.775,000 ක් වැය කර එම මධ්‍යස්ථාන 4 ක් පමණක් පිහිටුවා තිබුණි.

(ඇ) ළමා සංවර්ධනයට මාධ්‍ය වැඩමුළු හා ප්‍රකාශන සඳහා වැඩසටහන් 20 ක් පැවැත්වීමට රු.500,000 ක් ප්‍රතිපාදන සළසා තිබුණත්, එම ප්‍රතිපාදන උපයෝජනය කර වැඩසටහන් 10 ක් පමණක් පවත්වා තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තු සඟරා 2 ක් සකස් කිරිමට රු.500,00 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, ඉන් රු.461,000 ක් උපයෝජනය කර එක් සඟරාවක් පමණක් මුද්‍රණය කර තිබුණි.

(ඉ) අවදානම් සහිත ළමුන් හඳුනා ගැනීමේ සමීක්ෂණයක් පැවැත්වීම සඳහා සළසා තිබුණු රු.1,000,000 ක ප්‍රතිපාදන මුළුමණින්ම උපයෝජනය කර තිබුණත්, සමීක්ෂණ වාර්තා ලබාගෙන නොතිබුණි.

(ඊ) විකල්ප ආරක්ෂක ප්‍රතිපත්ති සකස් කිරීමට රු.50,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද එමගින් කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණි.

(උ) ග්‍රාමීය මට්ටමේ ළමා අයිතිවාසිකම් කමිටු පැවැත්වීම සඳහා සළසා තිබුණු රු.300,000 ක ප්‍රතිපාදනවලින් රු.249,000 ක් උපයෝජනය කර තිබුණත්, එවැනි කමිටු පවත්වා නොතිබුණි.

(ඌ) ජාල හා සම්බන්ධීකරණ කටයුතුවලට රු.50,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණද ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 4.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 6 | 2 | 4 |
| (ii) | තෘතියික මට්ටම | 240 | 236 | 4 |
| (iii) | ද්විතියික මට්ටම | 224 | 170 | 54 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 13 | 4 |
| | එකතුව | 487 | 421 | 66 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 66 ක් පිරවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.